# අත්තම්මාගේ පෙර සූදානම හා අරපිරිමැස්ම



එම්. පී. තරුෂි තුරුණුවර

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේනම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන ''හෙරණගත්කරණී'' ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මාහට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛනකරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

# පිදුම

අකුරු කර

මාගේ නැණ නුවණ

පෑදීමට ඇප කැප වී

වෙහෙස මහන්සි වන

මාගේ ආදරණීය පංති භාර ගුරුතුමිය වෙත

හරසරින් පුදමි.

# ස්තූතිය

මාගේ මුල්ම ගුරුවරිය වූ

අම්මා වෙත.

අපි හැමෝටම යම්කිසි දෙයක් කරන්න කලින් පෙර සූදානමක් තිබෙන්න ඕනෑ. ඒ පාඩම අපට හොඳින්ම කියාදෙන කෙනා තමයි අපේ අත්තම්මා. අපේ අත්තම්මා පිනට, දහමට බොහොම කැමති කෙනෙක්. හැම පෝයකටම සිල් අරගන්නවා. එයා පෝයට කලින් දවසෙ සිල් රෙදි සහ අවශ්‍ය අනෙකුත් දේ සූදානම් කරලා තියෙනවා. පසුවදා එයා උදෙන්ම හරි සතුටින් පන්සල් යනවා.




ඒ වගේම තමයි අත්තම්මා අපේ ගෙදර කෑම පිසීමට කලින් වෙනත් භාජනයකට හාල් වලින් මිටක් දමනවා. ඒකට කියන්නේ ''මිටි හාල් මුට්ටිය'' කියලා. මාසයක් විතර යද්දි මේ මිටිහාල් මුට්ටිය පිරෙනවා. එයින් අපට හදිස්සියෙ ගෙදර හාල් නැති උනහම ගන්නත් පුළුවන්, නැත්නම් ඉස්සර නම් මේ හාල් මුට්ටියෙන් හාල් හිඟන්නන්ට දෙනවා කියලා අත්තම්මා කියනවා. ඒක ඉතිරි කිරීමක් වගේම අසරණ කෙනෙකුට පිනට දෙන්නත් පුළුවන් වෙනවා කියලා තමයි අත්තම්මා කියන්නේ.



හැමදේම කඩෙන් ගේනකල් අත්තම්මා ඉන්නේ නෑ. අත්තම්මා එළවළු වගාවක් හදලා තියෙනවා. මම ගමේ ගිය හැටියෙම යන්නේ අත්තම්මගේ එළවළු කොටුවට. එතන හරිම ලස්සනයි. ඒ කොටුවෙ තක්කාලි, වම්බටු, කැකිරි, වට්ටක්කා, බණ්ඩක්කා, වැටකොළු, මෑකරල් ආදි එළවළු වගා කරලා තියෙනවා. ඒ අතර ගොටුකොළ, කංකුං, රතු තම්පලා වගේ පලා වර්ග ද පැත්තකින් කොහිල වගාවක් ද, බතල පාත්ති කිහිපයක් ද වගා කර තිබුණා. හදිසියේ

ගෙදරට අමුත්තෝ කිහිපදෙනෙක් ආවොත් කඩේ යන්න ඕන නැහැ. වස විස නැති එළවළු, පලා වර්ග ගෙවත්තෙන්ම ලබාගන්න පුළුවන්. බලන්නකෝ අපේ අත්තම්මගෙ අර පිරිමැස්ම. ඒ විතරක් නොවේ. පළතුරු වර්ගත් වගා කරලා තියෙන්නේ. අඹ, වෙරළු, පේර, අලිගැටපේර, ගස්ලබු, ජම්බු, දොඩම්, වැල් දොඩම් සහ නෙල්ලි වගේ දේශීය පළතුරු අත්තම්මා වගා කරලා තියෙනවා.



ඒ විතරක් නෙමෙයි පුංචි යාළුවනේ, අත්තම්මා පොල්තෙල් හිඳගන්නත් දන්නවා. පොල් තෙල් හිඳින්න වෙනම පොල් ගසක් අත්තම්මා තියලා තියෙනවා. ඒ ගසේ පොල් කෑමට ගත්තේ නැහැ.

පොල් තෙල් ඒ කාලේ හිඳගත්තේ මෙහෙමයි. අර ගහෙන් වේලිච්ච ගෙඩි දහයක් පහළොවක් කඩාගෙන ඒ පොල් ටික ගා ගන්නවා. ගා ගත්ත පොල් ටිකට වතුර දාලා ලිපේ තියෙනවා. ඒවා හොඳට තැම්බුණාට පස්සේ කිරි මිරිකලා අරන් ඒ කිරි ටික හොඳට පැස්සවනවා. මේක

නිමෙනකොට වළඳේ මතුපිට තෙල් තට්ටුවක් පෑදිලා තියෙනවා. මේ තෙල් හැන්දකින් ගානකට වෙන් කරලා අරන් අයෙත් ලිපේ තියලා පෑස්සවනවා.

එතකොට හොඳ තෙල් ටික තාච්චියේ උඩට බේරිලා එනවා. ඊට පසුව හොඳ තෙල් ටික පෙරලා ගන්නවා. නිමුනට පස්සේ බෝතල්වලට දමනවා. මේ විදියට තමයි ඉස්සර අත්තම්මා තෙල් හිඳගත්තේ.

අත්තම්මා අදටත් තෙල් හිඳගන්නේ ගෙදරම තමයි. අද නම් ඉස්සර වගේ

නෙමෙයි, පොල් බිඳලා වේලෙන්න දානවා. වේලුනාම පොල් කටුවෙන් ගලවලා අරන් චූටි කෑලිවලට කපනවා. ඒවා ආයෙමත් අව්වේ හොඳට වේලනවා. පොල් කෑලි හොඳින් වේලුනාම තෙල් හිඳින මෝලට ගෙනියලා තෙල් ටික හිඳගන්නවා.


අත්තම්මාගේ මම දැකපු තවත් දෙයක් තමයි, අත්තම්මා රෑට කාලා ඉතුරු වන බත් විසි කරන්නේ නෑ. ඒ බත් වලින් අත්තම්මා දිය බත් හදනවා. සමහර වෙලාවට ඒ බත් වේලලා රසම රස අග්ගලා හදලා දෙනවා.

මම ගමේ ගියාට පස්සේ තවත් දෙයක් දැක්කා. ඒක තිබුණේ අත්තම්මාගේ ගෙදර පිටුපස ඒක පුංචි ගෙයක්. මම අත්තම්මගෙන් ඇහුවා අර පුංචි ගේ මොකක් ද කියලා. අත්තම්මා මාව එතැනට එක්ක ගිහින් මෙහෙම කිවුවා.

''පුතේ මේකට කියන්නේ දර ගෙය, නැත්නම් දර මඩුව කියලා''.

මම දැක්කා ඒක ඇතුලේ පිළිවෙළකට දර අසුරලා තිබුණා. පොල් ලෙලි, පොල් කටු වෙන වෙනම උරවලට දාලා තිබුණා. හනසු කපලා මිටි බැඳලා උඩ එල්ලලා තිබුණා.

ඒ විදිහටම පොල් කොළ මිටි බැඳලා උඩ එල්ලලා තිබුණා.



ඒ ගමන්ම අත්තම්මා මට මෙහෙමත් කිව්වා. ''පුතේ මේවා අපි හැම වෙලාවෙම පාවිච්චියට ගන්නේ නෑ. එක දිගට වහින කාල එනවා. ඒ කාලවලදි ප්‍රයෝජනයට ගන්න තමයි මේ දර අසුරලා තියෙන්නේ. එදිනෙදාට අවශ්‍ය දර අපි වත්තෙන් හොයා ගන්නවා''. වහින කාලවලට දර හොයන්න අපහසු නිසාත් තෙමුණ දර ප්‍රයෝජනයට ගන්න බැරි නිසාත්, තමයි අත්තම්මා මේදේ කරලා තියෙන්නේ.

ඉතින් බලන්නකෝ යාළුවනේ අත්තම්මාගේ පෙර සූදානමයි,

අරපිරිමැස්මයි. වත්තේපිටියේ තිබුණු දෙවල්වලින් ප්‍රයෝජන ගත්ත හැටි, කොච්චර වටිනවද? කඩවලට යන කොච්චර මුදලක් ඉතිරි කරන්න ඇද්ද? ලෝකය කොහොම වෙනස් උනත් මේ සිරිත් පුරුදු වෙන එක අපි කාටත් හොඳයි නේද පුංචි යාළුවනේ?

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි.පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක

සෙනෙවිරත්න මහලේකම්